Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

### කොන්ත්‍රාත් පදනම මත බර වාහන රියැදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරට බඳවා ගැනීම - 2018

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව සඳහා කොන්ත්‍රාත් පදනම මත බර වාහන රියැදුරු (අර්ධ ශිල්පීය) තනතුරට බඳවා ගැනීමේ සුදුස්සන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.11.05 වැනි දිනට හෝ ඊට පෙර ලේකම්, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව, අංක 15, ගුරුදෙණිය පාර, තලාතුඔය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙලවරේ තනතුර පැහැදිලිව සටහන් කල යුතුය.

| අනු. අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | බර වාහන රියැදුරු | 01 |

01. *වැටුප් පරිමාණය:*

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන පහත පරිදි වැටුප් ගෙවනු ලැබේ.

මාසික දීමනාව - රු. 20,462.00
ගැලපුම් දීමනාව - රු. 4,629.00
ජීවන වියදම් දීමනාව - රු. 7,800.00

02. *අධ්‍යාපන සුදුසුකම්:*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06කින් සමත් වීම, මින් විෂයන් 05ක් එක් වරක දී සමත් වී තිබිය යුතුය.

03. *වෘත්තීය සුදුසුකම්:*

තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන, බර ටේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියැදුරු බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ඒ හා යන්ත්‍ර ක්‍රියාකරවීමට අදාළව බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව ඩී හා ජේ පන්තියේ බලපත්‍රයක් තිබීම.

ඉහත බලපත්‍රයට අතිරේකව අදාළ වන යන්ත්‍ර ක්‍රියා කිරීම සම්බන්ධව රජය පිළිගත් ආයතනයකින් (NAITA/ICTDA) පුහුණුව ලැබූ බවට (NVQ - 4 මට්ටමට නොඅඩු) පුහුණු සහතිකය ලබා තිබිය යුතුය.

මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පලපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයක ප්‍රථිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රථිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගේ ඉහලම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

05. *කායික සුදුසුකම් :*

I. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 අගල් 02 1/2 ක් විය යුතුය.

III. මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැණුමක් තිබිය යුතුය.

06. *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු උපරිම අවු. 45ට නොවැඩි විය යුතුය. පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නන් සම්බන්ධයෙන් හා රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

07. *වෙනත් සුදුසුකම්:*

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරු පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
III. මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැණුමකින් යුක්ත විය යුතුය.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ *ගැසට්* නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කල යුතුය.

08 (1) ඉල්ලුම් පත්‍රය සෙ. මි. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කල යුතු අතර, 1-09 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද 10 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කල යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූලව සකස් විය යුතුය.

***සැලකිය යුතුය :-***

සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය.

(11) රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත්‍ර එවිය යුතුය.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක කරන දිනය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන අතර, ඇබෑර්තු සියල්ලම හෝ කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

ලේකම්,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

කාර්යාල ප්‍රයෝජනය සඳහා

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

කොන්ත්‍රාත් පදනම මත බර වාහන රියැදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරට බඳවා ගැනීම- 2018

01 මුලකුරු සමග නම: ………………………………………………………………………………………

02 මුලකුරුවලින් හැඳින්වෙන නම:……………………………………………………………………………

03 ස්ථිර ලිපිනය:-…………………………………………………………………………………………

04 ජාතික හැඳුනුම්පත් අංකයඃ-
(ඡායා පිටපතක් ඇමිණිය යුතුය)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

05 උපන් දිනය ඃ-..............................................................................................

06 අයදුම්පත් කැඳවන අවසන් දිනට වයසඃ- අවු ...............මාස ............... දින...............

07 ස්ත්‍රී/ පුරුෂ භාවයඃ-..............................................................................................

08 විවාහක අවිවාහක බවඃ-..............................................................................................

09 අධ්‍යාපන සුදුසුකම්ඃ- අ.පො.ස (සා. පෙළ) විභාග ප්‍රතිඵල ඃ-
විභාග අංකයඃ-.................. විභාගයට පෙනීසිටි වර්ෂයඃ-...............

| විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

10 අධ්‍යාපන සුදුසුකම්ඃ- අ.පො.ස (උ. පෙළ) විභාග ප්‍රතිඵල ඃ-
විභාග අංකයඃ-............... විභාගයට පෙනී සිටි වර්ෂයඃ-...............

| විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11 වෘත්තීය සුදුසුකම්ඃ-
I ..............................................................................................
II ..............................................................................................
III..............................................................................................

12 පළපුරුද්දඃ-
I ..............................................................................................
II ..............................................................................................
III..............................................................................................

*අයදුම්කරුගේ සහතිකය*

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙක් වන බවත්, පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කල හැකි බවත් මා දනිමි.

...............
අයදුම්කරුගේ අත්සන.

දිනය ...............

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ....................................මයා/මිය/මෙනවිය ............../ ............../ .............. දින සිට ................................ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ............................වශයෙන් ස්ථිර/තාවකාලික/ අනියම් නිලධාරියෙකු/ නිලධාරිණියක වශයෙන් සේවය කරන බවත්, ඔහු/ ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අදාල ......................නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ ඇය මේ සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

..............................

ආයතන ප්‍රධානියාගේ අත්සන.

නිල මුද්‍රාව :

දිනය :.................................